**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.09 පැය 2345 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /695/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ ජන ක්‍රීඩා රැසක් සමගින් බක්මහ උළෙලක්.

2025 සිංහල හා හින්දු අළුත් අවුරුදු උදාව නිමිති කොට ගෙන ශ්‍රී ලංකා පොලිසියේ ක්ෂේත්‍ර බලකා මූලස්ථානයේ සියළුම නිලධරයන්ගේ සහභාගිත්වයෙන් බක්මහ උළෙල 2025.04.09 වන අද දින උදෑසන 0600 සිට දවස පුරා වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් දවස පුරා පැවැත්විණි.

සිංහල හා දමිළ සංස්කෘතික විදහා දක්වන ජන ක්‍රීඩා රැසකින් බක්මහ උළෙල සමන්විත වූ අතර උත්සවයේ සමාරම්භය සනිටුහන් කරමින් වැඩබලන පොලිස්පතිතුමන් විසින් ගම හරහා දිවීමේ කාන්තා හා පිරිමි තරඟ ඉසව් ආරම්භ කළ අතර එහි ජයග්‍රාහක ක්‍රීඩක/ක්‍රීඩිකාවන් සඳහා ත්‍යාග ප්‍රදානයක්ද සිදුකරන ලදි.

මෙම උත්සව අවස්ථාවට බස්නාහිර පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සංජීව ධමර්රත්න, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති උජිත් ලියනගේ, පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථාන අණදෙන නිලධාරිණී කාන්තා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි දශරීකා කුමාරි යන මහත්ම මහත්මීන් ඇතුළු පොලිස් නිළධරයන් රැසක් සහභාගි වූහ.

මෙම උත්සවයට අදාල ඡායාරූප කිහිපයක්


පොලිස් ක්ෂේත්‍ර
බක්මහ
උළෙල
2025



















**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**